# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2467/76 - 2025 දෙසැම්බර් මස 19 වැනි සිකුරාදා - 2025.12.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978(XVI) D

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වැනි වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදන ලද නියමාවලිය.

ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

2025 දෙසැම්බර් මස 11 වැනි දින,
කොළඹ දී ය.

නියමාවලිය

1. මේ නියමාවලිය 2025 අංක 03 දරන කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතන (සංශෝධන) නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර එය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට ක්‍රියාත්මක වන්නේ ය.

2. කලින් කල සංශෝධිත පරිදි වූ සහ 2009 මැයි මස 11 වැනි දිනැති අංක 1601/13 දරන රජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමාවලිය මගින් අවසන් වරට සංශෝධිත 1979 දෙසැම්බර් 26 වැනි දිනැති අංක 68/11 දරන රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද, 1979 අංක 9 දරන කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතන නියමාවලිය පහත සඳහන් පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(1) එහි 13 වන ඡේදයේ (අ) සිට (ඔ) (එකී ඡේද දෙකද ඇතුළත්ව) දක්වා ඇති උපඡේද පරිච්ඡින්න කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපඡේද ඊට ආදේශ කිරීමෙන් :-

“(අ) කෘෂි ජීව විද්‍යාව ;
(ආ) කෘෂි ඉංජිනේරු විද්‍යාව ;
(ඇ) කෘෂි ව්‍යාපෘති ;


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ඈ) සත්ත්ව විද්‍යාව;

(ඉ) ජීව සංඛ්‍යානය;

(ඊ) කෘෂි ආර්ථික විද්‍යාව;

(උ) භෝග විද්‍යාව;

(ඌ) ආහාර විද්‍යාව සහ තාක්ෂණය;

(එ) පැලෑටි සංරක්ෂණය;

(ඒ) පාංශු විද්‍යාව;

(ඔ) ව්‍යාපාර පරිපාලනය; සහ

(ඕ) බහු ශික්ෂණ අධ්‍යයන.''.

(2) එහි 14 වන ඡේදයේ (1) වන උපඡේදය පරිච්ඡින්න කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපඡේද ආදේශ කිරීමෙන් :-

"14 (1අ) බහු ශික්ෂණ අධ්‍යයන සඳහා වන අධ්‍යයන සභාව හැර අනෙකුත් සෑම අධ්‍යයන සභාවක්ම පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය :-

(අ) අධ්‍යක්ෂවරයා;

(ආ) කෘෂිකර්ම විද්‍යාවේ අදාළ විශේෂ ක්ෂේත්‍රයේ (අවස්ථාවෝචිත පරිදි) ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයෙකු හෝ මහාචාර්යවරයෙකු සහ වෙනත් ආචාර්යවරු හතර දෙනෙකු ඇතුළත් වන ලෙස උචිත විශේෂ ක්ෂේත්‍රයේ ආචාර්යවරුන් අතරින් විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨය විසින් නම් කරන ලද සාමාජිකයින් පස් දෙනෙක්;

(ඇ) උචිත කෘෂිකර්ම විද්‍යාවේ විශේෂ ක්ෂේත්‍රයේ විශිෂ්ටතාවක් ඇති තැනැත්තන් අතරින් කළමනාකරණ මණ්ඩලය විසින් පත් කරන ලද සාමාජිකයින් තුන් දෙනෙක්; සහ

(ඈ) පනත යටතේ පිහිටුවන ලද හෝ පිහිටුවන ලද බවට සලකනු ලබන විශ්වවිද්‍යාලවල එක් එක් කෘෂිකර්ම පීඨ අතරින්, එකී එක් එක් අදාළ පීඨය විසින් නම් කරන ලද, සාමාජිකයන් තිදෙනෙකුට වඩා වැඩි නොවන එක් එක් අදාළ විශේෂ ක්ෂේත්‍රයේ එක් ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයෙකු, මහාචාර්යවරයෙකු හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු.''.

(1ආ) බහු ශික්ෂණ අධ්‍යයන සඳහා වන අධ්‍යයන සභාව පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය:-

(අ) අධ්‍යක්ෂවරයා;

(ආ) විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ ආචාර්යවරුන් අතරින් නම් කරන ලද, 13 වන ඡේදයේ (අ) සිට (ඕ) (එකී ඡේද දෙකද ඇතුළත්ව) දක්වා ඇති උපඡේදවල සඳහන් කෘෂිකර්ම විද්‍යාවේ විෂය ක්ෂේත්‍රයේ ප්‍රවීණතාව සහිත සාමාජිකයන් එකළොස් දෙනෙකු; සහ

(ඇ) ස්වභාවික විද්‍යාව, තාක්ෂණය, කළමනාකරණය සහ සමාජ විද්‍යාවන් ඇතුළත් වන ලෙස අදාළ බහු ශික්ෂණ විෂය ක්ෂේත්‍රවල කැපී පෙනෙන පුද්ගලයන් අතරින් තෝරා ගත් සහ කළමනාකරණ මණ්ඩලය විසින් පත් කරනු ලබන සාමාජිකයන් තිදෙනෙකු,''.

(3) එහි 25 වන ඡේදයේ, "කෘෂිකර්මයෙහි විශේෂ ක්ෂේත්‍රය'' යන යෙදුමේ අර්ථනිරූපනය පරිච්ඡින්න කොට ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථනිරූපනය ආදේශ කිරීමෙන් :-

"කෘෂිකර්ම විද්‍යාවේ විශේෂ ක්ෂේත්‍රය යන්නෙන්, කෘෂි ජීව විද්‍යාව, කෘෂි ඉංජිනේරු විද්‍යාව, කෘෂි ව්‍යාප්ති, සත්ත්ව විද්‍යාව, ජීව සංඛ්‍යානය, කෘෂි ආර්ථික විද්‍යාව, භෝග විද්‍යාව, ආහාර විද්‍යාව සහ තාක්ෂණය, පැලෑටි සංරක්ෂණය, පාංශු විද්‍යාව, ව්‍යාපාර පරිපාලනය, බහු ශික්ෂණ අධ්‍යයන හෝ ආයතනයේ සහ විශ්වවිද්‍යාලයේ නිර්දේශය මත කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන වෙනත් යම් විශේෂ ක්ෂේත්‍රයක් අදහස් වේ; සහ''.

EOG 12 - 0188

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.